සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 50 S I,II

නම: ........................................ | නාට්‍ය හා රංග කලාව | කාලය පැය තුනයි

- ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ගද්‍ය පද්‍ය ඇසුරෙන් 1 - 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා

B - විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිසුන් ඇත.

C - වඩිග පුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
කළ වඩිග පටුනෙන් - මෙසේ බමුණෝ යාග කරමින්

D - එක දරුවෙක් වඩාගෙන නම් කීයක් කියෙව්වා ද ? හරිම වැඩක්නෙ බොල.

E - සොබනා ගගේ ගං ඉවුරේ පැලක ඉ ද
හඩනා කදුළු ගඟ පහළින් ගියේ කිම ද

01. A පද්‍යය අයත් වන්නේ ,
I. දහඅට සන්නිය. II. රටයකුම. III. සූනියම් යාගය. IV. සොකරි.

02. බෞද්ධ පූජාකර්ම ඇතුළත් දෙබස් කාණ්ඩ අයත් වන්නේ ,
I. A II. B III. C IV. D

03. D දෙබස් කාණ්ඩය අයත් නාට්‍යමය පෙළපාලිය වන්නේ ,
I. කපුයක්කාරිය . II. නානුමුරය. III. දරු නැලවිල්ල. IV. සූනියම් යක්ෂනියක පැමිණීම.

04. විත කැපීම හෙවත් මැණික් පාල ශාන්ති කර්මයට අයත් වන්නේ ,
I. A II. B III. C IV. D

05. E - පද්‍ය සංවාදය ගායනා කරනු ලබන්නේ ,
I. දික්තලා. II. මහෞෂධ පඬිතුමා. III. දික් පිටිය. IV. කාලගෝල.

- නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

06. නාට්‍ය කලාව ආරම්භ වීමට මූල බීජය වන්නේ ,
I. සංස්කෘතික උත්සව නිසා ය. II. බෞද්ධාගම නිසා ය.
III. අභිචාර විධි නිසා ය. IV. ප්‍රාසාංගික කලාවක් නිසා ය.

07. පහත සඳහන් නිර්වචනය හා එය ප්‍රකාශ කළ තැනැත්තා නිවැරදිව සඳහන් වන වරණය වන්නේ ,
I. නාට්‍යයක් යනු ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීමයි. - භරතමුණි.
II. ක්‍රියාවක් අනුකරණය කිරීම නාට්‍යයයි - බර්නාඩ් ෂෝ.
III. අවස්ථාවක් අනුකරණය කිරීම නාට්‍යය යි - ඇරිස්ටෝටල්.
IV. නාට්‍යය යනු සමාජයට කැඩපතක් ඇල්ලීමකි. - ධනංජය.

08. නාට්‍ය කලාවේ මූලික අරමුණ වන්නේ ,
I. උපදේශයක් ලබා දීම ය. II. නිර්මාණයක් කිරීම ය.
III. දැනුම ලබාදීම ය. IV. ප්‍රේක්ෂකයාට සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දීම ය.

9. ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවන් ලෙස හැඳින්වෙන්නේ ,
I. චිත්‍ර , බැලේ , ඔපෙරා හා මුද්‍රා නාට්‍ය.
II. වේදිකා නාට්‍ය , බැලේ , මුද්‍රා නාට්‍ය හා නර්තන ප්‍රසංග.
III. චිත්‍රපට , වේදිකා නාට්‍ය , කැටයම් , බැලේ නාට්‍ය.
IV. චිත්‍ර , කැටයම් , වේදිකා නාට්‍ය , බැලේ නාට්‍ය.

10. නාට්‍යයක් රඟ දක්වන මොහොතේ දී එහි සාර්ථකත්වයට අනිවාර්යයෙන්ම සිටිය යුත්තේ ,
I. නාට්‍ය පෙළ රචකයා ය.
II. නාට්‍ය ශාලා භාරකරු ය.
III. නාට්‍ය සංවිධායකවරයා ය.
IV. ප්‍රේක්ෂකයෝ ය.

11. භරත නාට්‍යම් හි රාධා ක්‍රිෂ්ණා , ශිව පාර්වති , රාමා සීතා නර්තන විලාසයන් අයත් වන්නේ ,
I. නෘත්ත.
II. නෘත්‍ය.
III. නාට්‍ය.
IV. ක්ෂණික නිරූපණ.

12. පංචේන්ද්‍රියන් මගින් ලබා ගන්නා අත්දැකීම් තවත් අයකුට තේරුම් ගත හැකි අන්දමින් මවා දැක්වීම.
I. රූපණය යි.
II. තාලානුකූල චලනය යි.
III. පරිකල්පනය යි.
IV. ස්වාභාවික චලනය යි.

13. නාට්‍යයක් යනු බොහෝ කලා ශිල්පීන්ගේ සාමූහික ප්‍රයත්නයක මනා ප්‍රතිඵලයකි.මෙම කියමනට අයත් නොවන්නේ,
I. නළු නිළියන් ය.
II. ප්‍රේක්ෂයකයින් ය.
III. ආනුෂාංගික ශිල්පීන් ය.
IV. පාඨකයන් ය.

14. නිර්මිත චලනයකි ,
I. උඩ පැනීම.
II. නොන්ඩි ගැසීම.
III. දිවීම.
IV. නැවීම.

15. ඉටි පන්දමක් , හිම කන්දක් හෝ අයිස් කැටයක් සේ දියවීම යන රංග අභ්‍යාසය අයත් වන්නේ ,
I. දර්පණ අභ්‍යාස.
II. ස්වසන අභ්‍යාස.
III. ශිථිලීකරණ අභ්‍යාස.
IV. සංවේදන අභ්‍යාස.

- 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් නාට්‍ය ගීත ඇසුරින් පිළිතුරු සපයන්න.

A - දිකිරි දිකිරි
B - සෝබාව දේ මෙපුර
C - ප්‍රේමයෙන් මන රංජිත වේ
D - මූදු පතුල යට ඉඳලා
E - කුමටද සොබනියෙ කඳුළු සලන්නේ

16. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ නාට්‍ය නිර්මාණයකට අයත් වන්නේ ,
I. A II. B III. C IV. D

17. රතු හැට්ටකාරි නාට්‍ය නිර්මාණයට අයත් වන්නේ ,
I. A II. B III. C IV. D

18. තාරාවෝ ඉගිලෙති නාට්‍යයට අයත් වන්නේ ,
I. A II. B III. D IV. E

19. හෙන්රි ජයසේන මහතාගේ නාට්‍ය නිර්මාණයට අයත් වන්නේ ,
I. B II. C III. D IV. E

20. ජන කතා දෙකක් පාදක කොටගෙන නිර්මාණය වූ නාට්‍යය සඳහා අයත් වන්නේ ,
I. A II. C III. D IV. E

21. අංග රචනයේ දී මුහුණ බෙදෙන ප්‍රධාන කොටස් ගණන ,
I. 4 යි. II. 5 යි. III. 6 යි. IV. 2 යි.

22. මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන්වල විවිධ හැඩ සැකසීම සඳහා භාවිතා කරනු ලබන්නේ ,
1. ස්ප්‍රිට් ගම්.
II. ක්‍රේප් හෙයා.
III. පෆ් පවුඩර්.
IV. නෝස් පොටි.

23. දික්තල කාලගෝල නාට්‍යයේ පූර්ව රංගයේ දී වේදිකාවට පැමිණෙන්නේ ,
I. දේශනවාදින් II. හඬ දූතයින්. III. බහුබූත කෝලම. IV. සෙල්ලම් ළමා.

24. දික්තල කාලගෝල නාට්‍යයේ දික්තලාගේ මව්පියන්ගේ නම් සඳහන් වරණය වන්නේ ,
I. දන්ත චූල හා චූල දන්තීය. II. කිරි සන්ද හා සෙම්බරි ය.
III. චමරි හා කයිදා ය. IV. හේතුපානි හා දික් සුරඹිය.

25. නාට්‍ය ගීත හා නාට්‍ය සංගීතය අයත් වන අභිනය වන්නේ ,
I. ආංගික හා වාචික අභිනය. II. වාචික හා ආහාර්ය අභිනය.
III. ආහාර්ය හා වාචික අභිනය. IV. වාචික හා සාත්වික අභිනය.

• 26 - 30 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | රචකයා | අනුවර්තන හෝ පරිවර්තන නාට්‍ය | අනුවර්තක / පරිවර්තක |
|---|---|---|---|
| ද රයිවල්ස් | ෂෙරිඩන් | මනාලයෝ | ක |
| ග | සොෆොක්ලිස් | බෙර හඬ | බන්දුල ජයවර්ධන |
| ද ජස්ට් (The just ) | ඇල්බෙයා කැමූ | ට | පරාක්‍රම නිරිඇල්ල. |
| ද සින්ක් කැරැක්ටස් ඔෆ් වැචන් | ඩ | හරිම බඩු හයක් | සුගතපාල ද සිල්වා. |

26. ක අක්ෂරයට අදාළ රචකයා වන්නේ ,
I. පරාක්‍රම නිරි ඇල්ල. II. බන්දුල ජයවර්ධන.
III. හෙන්රි ජයසේන. IV. සුගතපාල ද සිල්වා.

27. ග අක්ෂරයට අයත් මුල් කෘතිය වන්නේ ,
I. ඉක්නොවුටා ඉ II. ද හෝස්.
III. මදර් කරේජ්. IV. ද ග්ලාස් මෙනාජරි.

28. ට අක්ෂරයට අයත් නාට්‍යයේ පරිවර්තකයා වන්නේ ,
I. ජන හතුරා. II. සකල ජන. III. විනිශ්චය. IV. කපුවා කපෝති.

29. ඩ අක්ෂරයට අයත් විදේශිය නාට්‍ය රචකයා වන්නේ ,
I. සැමුවෙල් බෙකට්. II. ටෙනසි විලියම්.
III. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්. IV. ලුයිජි පිරැන්ඩලෝ.

30. පරාක්‍රම නිරිඇල්ල මහතා නිර්මාණය කළ මෙම නාට්‍යයට අමතරව වෙනත් නාට්‍යයක් වන්නේ ,
I. චරන්දාස්. II. තට්ටු ගෙවල්. III. පුස්ලෝඩං. IV. අහස් මාලිගා.

31. දික්තල කාලගෝල නාට්‍යයේ නාට්‍ය ධර්මි ලක්ෂණයක් නොවන්නේ ,
I. සංවාද තාලානුකූලව හැසිරවීම. III. පොතේ ගුරුගේ චරිතයක් තිබීම.
III. වේදිකා පසුතල භාවිතය. IV. පූර්ව රංගයක් තිබීම.

32. රංගෝපකරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ ,
I. නළු කාර්යයට බාධාවක් නොවීම. II. නාට්‍යයේ අර්ථය හා බැඳි නොපැවතීම.
III. පහසුවෙන් පරිහරණය කළ හැකි වීම. IV. සරල හා සැහැල්ලු බව.

33. රංග භූමියක තිබිය යුතු මූලික අවශ්‍යතාවයක් වන්නේ ,
I. පසුතල ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් තිබීම.
II. සංගීත ශිල්පීන් සඳහා විශේෂ ස්ථානයක් තිබීම.
III. නාට්‍යෝපකරණ තැන්පත් කිරීමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම.
IV. සමතලා බිමක් සහ ප්‍රමාණවත් අවකාශයක් තිබීම.


34. කෝලම් හා නාඩගම් රංග භූමිය පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ ,
I. තානායම් පල හා කරලිය . II. සබය හා තානායම් පල.
III. කරලිය හා තානායම්පල. IV. කමත හා කරලිය.

35. නාට්‍යයක සංවාද භාවිතයේ දී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණකි.

I. එකම රිද්මයකට උච්චාරණය කිරීම. II. සංවාද පැහැදිලිව උච්චාරණය කිරීම.
III. අධික උස් හඬින් උච්චාරණය කිරීම. Iv. ප්‍රේක්ෂකයාට නො ඇසෙන ලෙස උච්චාරණය කිරීම.

• **36 - 40 දක්වා ප්‍රශ්න වලට පහත ඡායාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.**


ක


ග


ට


ඩ


ජ

36. ''අනේ අබිලික් '' නාට්‍යයේ රඟපෑමෙන් ක්ෂේත්‍රයට පිවිසුණු නාට්‍යකරුවෙක් වන්නේ ,

I. ක II. ග III. ට Iv. ඩ

37. ඉංග්‍රිසි නාට්‍ය සඳහා රංගන දායකත්වය ලබා දුන් රංගන ශිල්පියා/ ශිල්පිණිය වන්නේ,

I. ග II. ට III. ඩ Iv. ජ

38. කුවේණි , හුණුවටයේ කතාව , අහස් මාලිගා යන නාට්‍ය වල රංගන දායකත්වය ලබා දුන් රංගන ශිල්පියා / ශිල්පිනිය වන්නේ ,

I. ක II. ග III. ට Iv. ජ

39. 70 දශකයේ නාට්‍ය රංගනය සඳහා ප්‍රවිෂ්ට වී බෙරහඬ , තාරවෝ ඉගිලෙති යන නාට්‍ය වල රංගන දායකත්වය ලබා දුන් රංගන ශිල්පියා / ශිල්පිනිය වන්නේ ,

I. ක II. ග III. ඩ Iv. ජ

40. විකෘති , දිරිය මව , ධවල භිෂණ යන නාට්‍ය වල රංගන දායකත්වය ලබා දුන් රංගන ශිල්පියා / ශිල්පිනිය වන්නේ ,

I. ග II. ට III. ඩ Iv. ජ

(5) WWW.PastPapers.WiKi (4)



Download Term Test Papers, Short Notes From One Place!

## II කොටස

- පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
    I. දික්තල කාලගෝල නාට්‍යය අයත් ශෛලිය හා සම්ප්‍රදාය නම් කරන්න.
    II. මෙම නාට්‍ය මුල්ම වරට රඟ දැක්වූ වර්ෂය හා ස්ථානය ලියන්න.
    III. කාලගෝලගේ මව හා පියා නම් කරන්න.
    IV. දික්තල කාලගෝල ව ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු 02 ක් සඳහන් කරන්න.
    V. මෙම ගැටලුව විසඳීමට මහෞෂධ පඩිතුමා යොදා ගන්නා උපක්‍රමය කුමක් ද?
    VI. මෙම නාට්‍යයේ දික්තලාගේ හා කාලගෝලගේ චරිත රඟපාන ශිල්පීන් දෙදෙනා නම් කරන්න.
    (ල. 02 × 6 - 12 )

02. I. පහතරට සම්ප්‍රදායේ ප්‍රචලිත ශාන්ති කර්ම 02 ක් නම් කරන්න.
    II. ඉන් ඔබ කැමැති එක් ශාන්ති කර්මයක අන්තර් රංග අවස්ථා 02 ක් සඳහන් කරන්න.
    III. ඉන් එක් රංග අවස්ථාවක් විස්තර කරන්න. ( ල. 2+4+6 )

03. I. රූපණය යනු කුමක් ද?
    II. අතීතයේ රූපණ කාර්ය ඉදිරිපත් කරන ලද ස්ථාන 04 ක් නම් කරන්න.
    III. වර්තමානයේ රූපණ කාර්ය සිදු කරන ස්ථානය විස්තර කර එහි භූගෝලීය බෙදීම ඇඳ දක්වන්න.
    (ල. 2+4+6)

04. I. නාට්‍යයක අංග රචනය අයත් වන්නේ කුමන අභිනයට දැයි නම් කරන්න.
    II. අංග රචනයේ ප්‍රභේද නම් කර ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
    III. ඔබ නාට්‍යයක අංග රචනා ශිල්පියා නම් ඔබ ඒ සඳහා සැලකිලිමත් වන කරුණු ලියන්න. (ල. 2+4+6)

05. I. " සොදුරු ආශ්‍රුදායකයා " නමින් නාට්‍ය පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථයරචනා කළ නාට්‍යකරුවා කවුරුන් ද?
    II. ඔහු විසින් නිෂ්පාදනය කළ නාට්‍ය 04 ක් නම් කරන්න.
    III. නාට්‍ය කලාවට ඔහුගෙන් සිදු වූ සේවය විස්තර කරන්න. ( ල. 2+4+6 )

06. I. රංග ක්‍රීඩා යනු කුමක්ද?
    II. රංග ක්‍රීඩා තුනක් නම් කරන්න.
    III. රංග ක්‍රීඩා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. ( ල. 2+4+6 )

07. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගෙන පරිදි නාට්‍ය පෙළ රචනා කරන්න.

    ගඟක් අසබඩ ඇති ගල්ලෙනක සිල්වත් තාපසවරයෙක් තපස් රකිමින් සිටී. දඩයක්කරුවෙක් මුවෙක් පසුපස ලුහු බඳිමින් ඒ අසලට පැමිණේ.......

    I. සුදුසු මාතෘකාවක් හා නිශ්චිත අවකාශය. ( ල.04 )
    II. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය. ( ල.04 )
    III. සංවාද දෙබස් සහිත පෙළ රචනය. ( ල.04 )
    ( 4+4+4 - 12 )

PAST PAPERS WIKI
(5) WWW.PastPapers.WiKi (5)



Download Term Test Papers, Short Notes From One Place!

## 10 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. II | 02. II | 03. Iv | 04. III |
| 05. III | 06. III | 07. I | 08. Iv |
| 09. II | 10. Iv | 11. III | 12. I |
| 13. Iv | 14. II | 15. III | 16. II |
| 17. I | 18. II | 19. III | 20. Iv |
| 21. III | 22. Iv | 23. III | 24. Iv |
| 25. II | 26. III | 27. I | 28. III |
| 29. Iv | 30. I | 31. III | 32. II |
| 33. Iv | 34. I | 35. II | 36. II |
| 37. I | 38. III | 39. II | 40. Iv |


### II කොටස

01. I. • නාට්‍ය ධර්මී ශෛලිය.
• නාඩගම් සම්ප්‍රදාය.
II. 1975 - ලුම්බිණි රඟහල.
III. මව - එමරි පියා - කයිද්‍රා
Iv. • විරූපි පුද්ගලයෙක් වීම.
•. වයස් පරතරය.
• අදහස් නොගැලපීම.
v. කාලගෝල , දික්තල , දික්පිටියව කැඳවා වෙන වෙන දෙමාපියන් පිළිබඳ ප්‍රශ්න කිරීම.
vI. දික්තල - මාදනි මල්වත්ත, මැණිකේ අත්තනායක
කාලගෝල - රිචඩ් වානමුලි , උදේනි චන්ද්‍රසිරි , සමන් ගුණසිංහ. ( 2×6 - 12 )

02. I. රටයකුම , දහඅට සන්නිය , සූනියම් යාගය. ( ල.02 )
II. රටයකුම - • නානුමරය. • කපුයක්කාරිය • දරුනැලවිල්ල.
දහඅට සන්නිය - • සූනියම් යක්ෂණිය ගේ පැමිණීම. • සන්නියකුන් 18 පැමිණීම.
• මහකෝල සන්නියකාගේ පැමිණීම.
සූනියම් යාගය - • වඩිග පටුන. ( ල.04 )

III. අනුකරණය , සමාරෝපය , සංවාද භාවිතය , අවස්ථා , නිරූපණය , ප්‍රේක්ෂක උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. ( ල.06 )
( 2+4+6 )

03. I. රූපණය යනු චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් වීම. ( ල.02 )
II. කමත , තානායම්පොල , කරලිය , සබය , බණ බඩුව. ( ල.04 )
III. ප්‍රොසීනියම් රංග භූමිය විස්තර කිරීම.



හැඩය නිවැරදිව නම් කර තිබීම. ( ල.06 )
( 2+4+6 )

04. I. ආහාර්ය අභිනය. ( ල.02 )
II.ප්‍රභේද 2 කි./ •. සරල අංග රචනය. • චරිතාංග අංග රචනය.
• සරල අංග රචනය යනු නළු නිළියන්ගේ පවත්නා ස්වරූපය ඒ අයුරින්ම පෙන්වීම.
• චරිතාංග අංග රචනය යනු චරිතයට අදාල පරිදි පුද්ගලයාගේ බාහිර පෙනුම වෙනස් කිරීම. ( ල.04 )
III. • නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම. •. නාට්‍ය අධ්‍යක්ෂකවරයා සමඟ සාකච්ඡා කිරීම.
• නාට්‍යයේ ශෛලිය , කාලය , යුගය , පිළිබඳ අවබෝධයක් ලැබීම.
• චරිත ස්වභාවය අධ්‍යනය කිරීම. • වර්ණ භාවිතය.
• අනෙකුත් ආනුෂාංගික ශිල්පීන් සමඟ සාකච්ඡා කිරීම. ( ල.06 )

05. I. සුගතපාල ද සිල්වා. ( ල.02 )
II. 10 ගුරුමාර්ගෝපදේශ සංග්‍රයයේ 55 පිටුව. ( ල.04 )
III. • ලෝක ධර්මී නාට්‍ය කලාවේ පුරෝගාමියා වීම. • තට්ටු ගෙවල් , බෝඩිංකාරයෝ වැනි ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදනය කිරීම. • ශ්‍රී ලංකිය නාට්‍ය කලාව දියුණු කිරීමට දායක වීම. • හිතහොද අම්මණ්ඩි , මූදු කුමාරි ආදි පරිවර්තන නාට්‍ය කලාව නිර්මාණය කිරීම. • ටෙලි නාට්‍ය , චිත්‍රපටි තිර රචනයෙහි යෙදීම. • නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ සොඳුරු ආඥදායකයා නමින් ශාස්ත්‍රිය ග්‍රන්ථයක් රචනා කිරීම. ( ල.06 )

PAST PAPERS WIKI
(1) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න